# පරීක්ෂක වාර්තාව

**අදියර II විභාගය - 2022 ජූලි**

## (203) ව්‍යාපාර නීතිය

(Business Law)

## A - කොටස

### ප්‍රශ්න අංක 01

ලකුණු 25 ක් සඳහා වාස්තවික ප්‍රශ්න 14 කින් මෙම ප්‍රශ්නය සමන්විත විය.

අයදුම්කරුවන් බොහොමයක් මෙම ප්‍රශ්නයට උත්තර ලියා තිබුණේය. ප්‍රශ්නය සඳහා වෙන් කොට තිබූ මුළු ලකුණු වලින් අර්ධයකට වඩා බොහොමයක් අයදුම්කරුවන් ලබාගෙන තිබුණේය. සමහර අයදුම්කරුවන් ප්‍රශ්න සඳහා වෙන් කළ මුළු ලකුණු වලින් ලකුණු 20 කට වඩා ලබාගෙන තිබුණේය.

සැලකිය යුතු අයදුම්කරුවන් ගණනක් ප්‍රශ්න අංක **1.14** ට නිවැරදිව උත්තර ලිවීමට අසමත්ව තිබූ බව දක්නා ලදී. බොහොමයක් අයදුම්කරුවන්ට වෙළඳපොළේ අභ්‍යන්තර කටයුතු වෙළඳාම පිළිබඳ දැනීමක් තිබී නැත. සමහර අයදුම්කරුවන් අංක **1.11** ප්‍රශ්නයට නිවැරදි උත්තර ලිවීමට අසමත් විය. එහෙත් ඇතැම් අයදුම්කරුවන් මෙම ප්‍රශ්නයට නිවැරදි උත්තර ලිවීමද කර තිබුණේය. අංක **1.13** ප්‍රශ්නය ඉතාමත් සරල ප්‍රශ්නයකි. එහෙත් සමහර අයදුම්කරුවන් විවිධ උත්තර ලියා තිබුණේය. අනෙකුත් ප්‍රශ්න වලට සතුටුදායක උත්තර ලියා තිබුණි.

මෙම ප්‍රශ්නය, සමත්වීමේ ඉලක්ක ලකුණු සීමාවට එළඹීමට ප්‍රබල දායකත්වයක් ලබාදී තිබුණේය.

**A කොටස** සඳහා ඉහළ ලකුණු ලබා ගැනීම පිණිස අයදුම්කරුවන් සිවිල් නීතිය, භාණ්ඩ විකිණීමේ ආඥාපනත, මුස්ලිම් නීතිය ,ගිවිසුම් නීතිය, ජාත්‍යන්තර නීතිය, කම්කරු නීතිය සහ වාණිජ නීතිය ඇතුළුව විෂය නිර්දේශයේ සමස්ත අන්තර්ගතය පිළිබඳ හොඳ දැනුමක් ලබා තිබිය යුතුය.

**මෙම ප්‍රශ්නය සඳහා සමස්ත කාර්යසාධනය සතුටුදායක මට්ටමක විය.**

## B කොටස

### ප්‍රශ්න අංක 02

මෙම ප්‍රශ්නය භාණ්ඩ විකිණීමේ ආඥාපනත මත පදනම් වී ඇත. මෙම සිදුවීම පදනම්වී ඇත්තේ භාණ්ඩ විකිණීම් ආඥා පනතේ ව්‍යංග කොන්දේසි මත වේ.

බොහොමයක් අයදුම්කරුවන් **(a) කොටසට** නිවැරදි උත්තර සපයා තිබූ අතර අදාල ව්‍යංග කොන්දේසිය නිවැරදිව හඳුනාගෙන තිබුණි. එනම් **ජේම්ස්** ට ලොරිය පිළිබඳ හිමිකමක් නැති බව සහ එහි සත්‍ය හිමිකරු **පීටර්** වන බවය. භාණ්ඩ විකිණීමේ ආඥාපනත අනුව දේපළ පවරන අවස්ථාව වන විට විකුණුම්කරුට භාණ්ඩ විකිණීම සඳහා හිමිකමක් තිබිය යුතුය. කෙසේ වෙතත් සමහර අයදුම්කරුවන් වැරදි උත්තර සපයා තිබුණේය.

**(b) කොටසින්** භාණ්ඩ විකිණීමේ ආඥාපනත යටතේ ගැනෙන භාණ්ඩ වර්ග පරීක්ෂා කර ඇත. බොහොමයක් අයදුම්කරුවන් **(b) කොටසට** නිවැරදිව උත්තර සපයා තිබුණේය.

**මෙම ප්‍රශ්නය සඳහා සමස්ත කාර්යසාධනය සතුටුදායක මට්ටමක විය.**

## ප්‍රශ්න අංක 03

මෙම ප්‍රශ්නයෙන් සමාගම් නීතිය පිළිබඳ දැනුම පරීක්ෂා කර ඇත. මෙය සමාගම් නීතිය පිළිබඳ තරමක් සරල ප්‍රශ්නයකි. සමාගමක අධ්‍යක්ෂකවරයෙකු වීමට සපුරාලිය යුතු සුදුසුකම් 4 ක් සඳහන් කිරීම **(a) කොටසින්** අවශ්‍ය කර තිබේ. කෙසේ වෙතත් සමාගම් පනත යටතේ සාකච්ඡා කර ඇත්තේ අධ්‍යක්ෂකවරයෙකු වීමට නුසුදුසුකම් ය. එබැවින් සමහර අයදුම්කරුවන් වක්‍රාකාරයෙන් සුදුසුකම් සඳහන් කර තබූ අතර තවත් සමහරු නුසුදුසුකම් සඳහන් කර තිබුණේය. ලකුණු පිරිනැමීමේ දී සුදුසු ක්‍රමයට දී තිබූ උත්තර සැලකිල්ලට ගෙන ලකුණු ලබා දුන්හ.

මෙම ප්‍රශ්නයේ **(a) කොටස** සඳහා බොහොමයක් අයදුම්කරුවන් නිවැරදි උත්තර සපයා තිබුණේ ය. **(b) කොටසින්** අවශ්‍යකර තිබුණේ සමාගම් පනත යටතේ අධ්‍යක්ෂකවරයෙකුගේ ප්‍රධාන යුතුකම් ලැයිස්තුගත කිරීමය.

මෙම ප්‍රශ්නයේ **(C) කොටසින්** අවශ්‍යකර තිබුණේ සීමාසහිත පෞද්ගලික සමාගමක් සඳහා අවශ්‍ය කෙරෙන අවම අධ්‍යක්ෂක වරුන්ගේ ගණන සඳහන් කිරීමය. ඇතැම් අයදුම්කරුවන් නිවැරදි උත්තර සපයා තිබුණේය.

**මෙම ප්‍රශ්නය සඳහා සමස්ත කාර්යසාධනය සතුටුදායක මට්ටමක විය.**

## ප්‍රශ්න අංක 04

මෙම ප්‍රශ්නය**,** පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරී පනත මත පදනම් වී තිබුණි. අයදුම්කරුවන් බොහොමයක් මෙම ප්‍රශ්නයට උත්තර සැපයීමට ඉදිරිපත් වී තිබූ අතර **(a) කොටස** සඳහා නිවැරදි උත්තර සපයා තිබුණේය. අදාල පනත නිසි ලෙස අධ්‍යයනය කර නොතිබීම නිසා අයදුම්කරුවන් කිහිප දෙනෙකුට **(a) කොටස** සඳහා නිවැරදිව උත්තර සැපයීමට අපොහොසත් වී තිබුණි. අයදුම්කරුවන් බොහෝ දෙනෙකුට **(b) කොටස** සඳහා ද නිවැරදි උත්තර සැපයීමට අපොහොසත් වී තිබිණි.

**මෙම ප්‍රශ්නය සඳහා සමස්ත කාර්යසාධනය සතුටුදායක මට්ටමක නොවීය.**

## ප්‍රශ්න අංක 05

මෙම ප්‍රශ්නය ගණුදෙනු කළ හැකි ලියවිලි මත පදනම් වී තිබුණි. දී තිබූ සිද්ධි දාමය සම්බන්ධයෙන් බැංකුවේ වගකීම පැහැදිලි කිරීම මෙම ප්‍රශ්නයේ **(a) කොටසින්** අවශ්‍ය කර තිබුණි. රේඛණය කළ චෙක් පතක් බැංකුවේ කවුන්ටරයෙන් මුදල් කර ගත නොහැකි බව අයදුම්කරුවන් තේරුම්ගත යුතුය. එමෙන් ම චෙක්පතක් වැරදි ලෙස ලියා තිබෙන විටද එය ප්‍රතික්ෂේප කිරීමට බැංකුවට බලය තිබේ. **(b) කොටසින්** අවශ්‍ය කර තිබුණේ සාමාන්‍ය රේඛණය සහ විශේෂ රේඛණය අතර වෙනස පැහැදිලි කිරීමය. බොහොමයක් අයදුම්කරුවන් මෙම ප්‍රශ්නයට උත්තර ලියා තිබූ අතර **(a)** සහ **(b) කොටස්** දෙකටම නිවැරදි උත්තර සපයා තිබුණේය. කෙසේවෙතත් අයදුම්කරුවන්ගෙන් කිහිප දෙනෙකුට **(a)** සහ **(b) කොටස්** සඳහා නිවැරදිව උත්තර සැපයීමට අපොහොසත් විය. අයදුම්කරුවන් බොහොමයකට ගනුදෙනු කළ හැකි ලියවිලි පිළිබඳව ප්‍රමාණවත් දැනුමක් තිබුණු බව නිරීක්ෂණය විය.

**මෙම ප්‍රශ්නය සඳහා සමස්ත කාර්යසාධනය සතුටුදායක මට්ටමක විය.**

## ප්‍රශ්න අංක 06

මෙම ප්‍රශ්නයෙන් රක්ෂණ නීතිය පිළිබඳ දැනුම පරීක්ෂාකරන ලදී. මෙය රක්ෂණ නීතියට සම්බන්ධ තරමක් සරල ප්‍රශ්නයකි. **අපේක්ෂාගේ** යැපෙන්න්නට ජීවිත රක්ෂණය යටතේ වන්දි ඉල්ලා සිටිය හැකි යැයි පැහැදිලි කිරීම **(a) කොටසින්** අවශ්‍ය කර ඇත. **(b) කොටසින්** රක්ෂණ ගිවිසුමක ප්‍රධාන මූලිකාංග 3 ක් සඳහන් කිරීම අවශ්‍ය විය. බොහොමයක් අයදුම්කරුවන් මෙම ප්‍රශ්නයට උත්තර ලියා තිබූ අතර **(a) කොටස** සඳහා නිවැරදි උත්තර සපයා තිබුණේ ය. රක්ෂණ ආවරණය සඳහා අයදුම් කිරීමේදී උපරිම විශ්වාසය පිළිබඳ මූලධර්මය **අපේක්ෂා** විසින් උල්ලංඝනය කර තිබූ හෙයින් ඇගේ යැපෙන්නන්ට රක්ෂණ වන්දි නොලැබෙන බව අයදුම්කරුවන් නිවැරදිව වටහාගෙන තිබුණේය. ප්‍රශ්නයේ **(b) කොටස** තරමක් පහසු වුවද සමහර අයදුම්කරුවන් එය වරදවා වටහාගෙන තිබුණේය. ඔවුන් රක්ෂණ ගිවිසුමක පාර්ශව කරුවන් පිළිබඳව සඳහන් කර තිබුණි.

**මෙම ප්‍රශ්නය සඳහා සමස්ත කාර්යසාධනය සතුටුදායක මට්ටමක විය.**

# C කොටස

## ප්‍රශ්න අංක 07

මෙම ප්‍රශ්නය කොටස් දෙකකින් සමන්විත විය.

**(A)** මෙම කොටස ගිවිසුම් නීතිය මත පදනම් විය.

**(a)** අර්පණය අවසන් විය හැකි ක්‍රම පරීක්ෂා කර ඇත. බොහොමයක් අයදුම්කරුවන් අර්පණය අවසන් විය හැකි ක්‍රම හඳුනාගෙන තිබූ නමුත් ඒවා පැහැදිලි කිරීමට ඔවුන් අසමත් වූ බව දක්නා ලදී. කෙසේවෙතත් ඔවුන්ට නිවැරදි උත්තර සපයා වෙන්කර තිබූ ලකුණු ලබා ගැනීමට හැකි විය.

**(b)** අයදුම්කරුවන් බොහොමයක් උත්තර සැපයීමට අපොහොසත් විය. වලංගු ගිවිසුමක් ඇති වීමට අර්පණය සහ ප්‍රතිග්‍රහණය විධිමත් ආකාරයට කළ යුතුය. එසේ වුවත් මෙම කාරණයේදී එය එලෙස සිදුවී නැත.

**(c)** බොහෝ අයදුම්කරුවන් නිවැරදි උත්තර සැපයීමට අසමත් විය. කෙසේනමුත් ප්‍රතිඅර්පණයක් තිබූ බැවින් වලංගු ගිවිසුමක් නොමැති බව සමහරක් අයදුම්කරුවන් නිවැරදිව වටහාගෙන තිබුණි.

**මෙම ප්‍රශ්නය සඳහා සමස්ත කාර්යසාධනය අසතුටුදායක මට්ටමක විය.**

**(B)** මෙම කොටස නියෝජ්‍යත්ව නීතිය මත පදනම් වි තිබිණි.

**(a)** මෙම කොටසින් නියෝජ්‍යත්ව නීතිය යටතේ කැතී සම්බන්ධයෙන් **වීණාගේ** යුතුකම් පැහැදිලි කිරීම අවශ්‍ය විය. **කැතීගේ** සේවකයෙකු වශයෙන් **වීණා, කැතීගේ** නියෝජිතයෙකු වන අතර නියෝජ්‍යත්වය තුළින් ඇය ලබා ගත් තොරතුරුවල රහස්‍යභාවය පවත්වා ගැනීම ඇගේ යුතුකමකි.

කෙසේ වෙතත් මෙම ප්‍රශ්නයට නිසි ලෙස උත්තර ලිවීමට අයදුම්කරුවන් වග බලාගෙන තිබුණේය.

**(b)** මෙම කොටසින් නියෝජ්‍යත්ව නීතිය යටතේ **කැතී** සහ **ටෝනි** අතර අයිතිවාසිකම් සහ යුතුකම් පිළිබඳ විමසීම අවශ්‍යකර තිබුණි. කෙසේ වුවද ඉහල මිලකට දේපළ මිලදී ගැනීමට නව ගැනුම්කරු කැමති බව හෙළි නොකිරීම හේතුවෙන් ප්‍රධානියා (principle) දී තිබූ උපදෙස් පිළිපැද නැත. එබැවින් නියෝජිතයෙකු ලෙස ඔහු සැලකිලිමත් වීමේ රාජකාරී අවශ්‍යතාවය පැහැර හැර ඇත. කෙසේ වුවත් අයදුම්කරුවන්ගෙන් බහුතරයකට මෙම කරුණු පැහැදිලි කිරීමට නොහැකි වී තිබුණේ ය.

**මෙම ප්‍රශ්නය සඳහා සමස්ත කාර්යසාධනය සතුටුදායක මට්ටමක විය.**

\- - -

<u>**විභාග අයදුම්කරුවන්ගේ සාධන මට්ටම දියුණු කර ගැනීමට සැලකිල්ල යොමුකළ යුතු පොදු කරුණු:**</u>

(1) නව විෂය නිර්දේශය පූර්ණ වශයෙන් හොඳින් අධ්‍යයනය කර තිබීම හා නව විෂය කරුණු පිළිබඳ වැඩි අවධානයක් යොමු කිරීම.

(2) ප්‍රශ්නය කිහිපවරක් කියවා බලා නිශ්චිත ඍජු උත්තර සැපයීම කළ යුතු අවස්ථාවලදී අනවශ්‍ය පැහැදිලි කිරීම් / විස්තර ලිවීම් නොකළ යුතුය.

(3) කළයුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව විභාගයට පෙර මැනවින් අධ්‍යයනය කිරීම සහ ප්‍රශ්න තුල භාවිත කර ඇති කළයුතු ක්‍රියාව තුලින් බලාපොරොත්තුවන උත්තර ක්‍රියා නිර්වචනයට අනුකූලවන ලෙස මැනවින් ඉදිරිපත් කිරීම.

(4) ස්ව-අධ්‍යන පාඩම්මාලාව සහ මෙම විෂයට අදාල ග්‍රන්ථ, අත්පොත්, ලිපි, සඟරා ආදිය මැනවින් පරිශීලනය කිරීම.

(5) උත්තර ලිවීමේදී මූලික න්‍යායාත්මක සංකල්ප නිවැරදිව හඳුනාගැනීමට හා සංසන්දනාත්මකව විමසීමට අවශ්‍ය කුසලතා ගොඩ නැගීම.

(6) අත් අකුරු කියවිය හැකි ආකාරයටත් ප්‍රශ්න අංක නිවැරදිව නිසි පරිදි යෙදීමටත් කටයුතු කළ යුතුය.

(7) ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස් නිවැරදිව පිළිපැදීම.

(8) පසුගිය විභාග ප්‍රශ්න පත්‍ර හා උත්තර පරිශීලනය කිරීමෙන් තම දැනුම ප්‍රගුණ කළ හැකිය.

(9) ව්‍යාපාර නීතිය හා අචාරධර්ම පිළිබඳ නිවැරදි අවබෝධයක් ලබා ගැනීම තුළින් එකිනෙක නීතිමය සංකල්ප ප්‍රායෝගික භාවිතයන්ට යොදවමින් ඒවා අතර ඇති වෙනස සංසන්දනාත්මකව ගොනු කිරීමේ හැකියාව තිබිය යුතුය.

(10) කාලය මනාව කළමනාකරණය කර ගැනීම.

(11) උත්තර පත්‍ර භාරදීමට පෙර ප්‍රශ්න අංක /විභාග අංකය ආදිය නිසිපරිදි යොදා තිබේදැයි නැවත පරීක්ෂාකර බැලීම.

(12) පෙර සූදානමක් සහිතව විභාගය සමත්වීමේ පරම චේතනාවෙන් ඉදිරිපත් වීම.

\- * * * -